## ගිවිසුම සහ ඇප බැඳුම්කරය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

- ගිවිසුමේ සහ ඇප බැඳුම්කරයේ පිටපත් දෙක බැගින් ලබා ගන්න. එය A4 ප්‍රමාණයේ පිරිසිදු කඩදාසියක දෙපැත්ත මුද්‍රණය විය යුතුය. ඒ අනුව ගිවිසුමේ පිටු 4 ක් ඇති බැවින් කොළ දෙකක දෙපැත්ත මුද්‍රණය කරගත යුතුය. සෑම වචනයක්ම පැහැදිලිව කියවිය හැකි පරිදි මනා තත්වයකින් මුද්‍රණය වී පැවතිය යුතුය. Black & White (කළු සහ සුදු) පිටපත් මුද්‍රණය කරගන්න.
- පැහැදිලි අත්අකුරෙන් නිල් පෑණකින් හිස්තැන් සම්පූර්ණ කරගත යුතුය. (යතුරු ලියනය ද කළ හැකි වේ)
- වරදක් සිදුවහොත් ටිපෙක්ස් භාවිතා නොකරන්න. තනි ඉරකින් වැරදුණ වචනය කපා එයට ඉහළින් නිවැරදි වචනය ඇතුළත් කරන්න. අකුර උඩ අකුරු ලියා නිවැරදි කළ නොහැක.
- මෙම ලේඛනයන්ට අත්සන් කළ යුත්තේ කාර්යාංශයට පැමිණ නිලධාරීන් ඉදිරිපිට දීය
- ගිවිසුම සහ ඇපබැඳුම්කරය අත්සන් කිරීම සඳහා ඔබට දැනුම් දෙන දිනයේ දී පමණක් කාර්යාංශයට පැමිණිය යුතුය. එම දිනට පැමිණීමට නොහැකි වුවහොත් වෙනත් දිනයක් දුරකථන ඇමතුමකින් ලබා ගන්න.
- ඇප බැඳුම්කරයේ සහ ගිවිසුමේ තොරතුරු පරස්පර නොවිය යුතුය
- හිස්තැන් අවසානයේ අංකයක් ඇත. එම අංකයට පහත පරිදි ඔබට අදාල තොරතුරු ඇතුළත් කරන්න. (හිස්තැන් වලට අදාල අංකය පහත දක්වා එම හිස්තැනට ඇතුළත් විය යුතු පිළිතුර අංක පිළිවෙලින් පහත දක්වා ඇත)

### ගිවිසුම

1. සේවා නියුක්තිකගේ ග්‍රාම නිලධාරී කොට්ඨාශය (කොට්ඨාශ අංකය ද සහිතව)
2. සේවා නියුක්තිකගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
3. සේවා නියුක්තිකගේ සම්පූර්ණ ලිපිනය
4. සේවා නියුක්තිකගේ ජාතික හැඳුණුම්පත් අංකය
5. සේවා නියුක්තිකගේ සම්පූර්ණ නම
6. කාර්යාංශය සමග මෙම ගිවිසුම අත්සන් කරන දිනය
7. රැකියාව ලැබී ඇති ඊශ්‍රායල් සමාගමේ නම
8. ඊශ්‍රායල් සමාගම සමග ඉහත රැකියා ගිවිසුම සේවා නියුක්තික අත්සන් කළ දිනය
9. ඇපකරුගේ ග්‍රාම නිලධාරී කොට්ඨාශය
10. ඇපකරුගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
11. ඇපකරුගේ ස්ථිර ලිපිනය
12. ඇපකරුගේ ජාතික හැඳුණුම්පත් අංකය
13. ඇපකරුගේ සම්පූර්ණ නම

### ඇප බැඳුම්කරය

1. ඇපකරුගේ ග්‍රාම නිලධාරී කොට්ඨාශය (කොට්ඨාශ අංකය ද සහිතව)
2. ඇපකරුගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
3. ඇපකරුගේ ස්ථිර ලිපිනය
4. ඇපකරුගේ ජාතික හැඳුණුම්පත් අංකය
5. ඇපකරුගේ සම්පූර්ණ නම
6. කාර්යාංශයේ දී මෙම ඇප බැඳුම්කරය අත්සන් කරන දිනය
7. සේවා නියුක්තිකගේ සම්පූර්ණ ලිපිනය
8. සේවා නියුක්තිකගේ සම්පූර්ණ නම
9. සේවා නියුක්තිකගේ ජාතික හැඳුණුම්පත් අංකය
10. රැකියාව ලැබී ඇති ඊශ්‍රායල් සමාගමේ නම
11. ඊශ්‍රායල් සමාගම සමග රැකියා ගිවිසුම සේවා නියුක්තික අත්සන් කළ දිනය
12. සේවා නියුක්තික කාර්යාංශය සමඟ ගිවිසුම අත්සන් කරන දිනය